# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1650/16 – 2010 අප්‍රේල් 21 වැනි බදාදා – 2010.04.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/22/09/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව.–

ජේ. ඒ. හෙට්ටිආරච්චි මහතා, බී/108/02, ගැමුණුපුර, අම්පාර

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, තැ.පෙ. 1826, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

**අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,**

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කොළඹ 06, ඩබ්ලිව්. ඒ. සිල්වා මාවත, අංක 181/1-503 හි, ටී. ඊ. සාන්තරාජන් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**අතාවුද සෙනෙවිරත්න,**
කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය.

2010 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/09/2008.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

ජේ. ඒ. හෙට්ටිආරච්චි මහතා, B/108/02, ගැමුණුපුර, අම්පාර

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, තැ.පෙ. 1826, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අම්පාර දිසා කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන ජේ. ඒ. හෙට්ටිආරච්චි මහතා 1990.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්යාල කම්කරු තනතුරෙහි IX ශ්‍රේණියට උසස් කිරීම මත, 1994.02.11 දිනැති අංක 11/94 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සංශෝධිත විධිවිධානයන් පරිදි ඔහු විසින් උපයාගනු ලැබූ වැටුප් වර්ධකයන් වැටුපට එකතු නොකිරීමේ හේතුවෙන් ඇති වූ වැටුප් විෂමතාවය ඉවත් නොකිරීම යුක්තිසහගතද යන්න හා යුක්තිසහගත නොවේ නම්, ඒ වෙනුවෙන් කොපමණ ප්‍රමාණයක මුදලක් හිඟ වැටුප් වශයෙන් ඔහුට ලැබිය යුතු ද යන්න පිළිබඳව වේ.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,**
කම්කරු කොමසාරිස්.

2010 මාර්තු මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.
05 - 73

---

මගේ අංකය: IR/09/13/2007.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

එස්. ආර්. ගුණවර්ධන මහතා, නො. 28/3ඒ, 4 වන පටුමග, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.

හා

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, නො. 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.

**අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,**

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න වන මම 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 194හි මහින්ද එස්. බී. රුළපනාව මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**අතාවුද සෙනෙවිරත්න,**
කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය.

2010 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/09/13/2007.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එස්. ආර්. ගුණවර්ධන මහතා, නො. 28/3ජී, 4 වන පටුමග, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.

සහ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, නො. 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල.

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් එස්. ආර්. ගුණවර්ධන මහතාගේ වැඩ තහනම් කරනු ලැබූ 2004.11.04 දින සිට 2007.05.09 දින දක්වා කාලසීමාව සඳහා වැටුප්, වැටුප් වර්ධක හා වෙනත් දීමනා ලබා ගැනීමට ඔහු හිමිකම් ලබන්නේ ද යන්න හා හිමිකම් ලබන්නේ නම්, ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳ වේ.

**ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,**
කම්කරු කොමසාරිස්.

2010 මාර්තු මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

05 - 74

---

මගේ අංකය: IR/10/45/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව.–

කේ. එම්. පී. අබේසිංහ බණ්ඩාර මයා, අංක 3/182, කුරුණෑගල පාර, කටුගස්තොට

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

**අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,**

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය, අතාවුද සෙනෙවිරත්න වන මම 1957 අංක 14, 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් දෙහිවල, රෝහල පාර, අංක 47/1 හි එම්. ආරිප් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**අතාවුද සෙනෙවිරත්න,**
කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍ය.

2010 මාර්තු මස 31 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/45/2008.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. එම්. ජී. අබේසිංහ බණ්ඩාර මයා, අංක 3/182, කුරුණෑගල පාර, කටුගස්තොට

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, කොළඹ 02.

**අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

ලංකා විදුලිබල මණ්ඩලයේ සැපයුම් සහකාර වරයෙකු වශයෙන් දැනට සේවය කරන කේ. එම්. ජී. අබේසිංහ බණ්ඩාර මහතාට එරෙහිව එම මණ්ඩලය විසින් විනය පරීක්ෂණයක් පවත්වා, ඉන් අනතුරුව 2003.05.26 දින සිට 2006.09.14 දින දක්වා වූ කාලසීමාව තුළ ඔහු සේවයෙන් පහකර තැබීම තුලින් ඔහුට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම් කේ. එම්. ජී. අබේසිංහ බණ්ඩාර මහතාට කුමන සහනයක් හිමිද යන්න පිළිබඳව ද වේ.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
කම්කරු කොමසාරිස්.

2010 මාර්තු මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.
05 - 75

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.